PAFFREL

# 2023 ඔක්තෝබර් මස දේශපාලන විශ්ලේෂණය

**(මැතිවරණ , ප්‍රජාතන්ත්‍රවාදය , ආර්ථිකය, මානව හිමිකම් /සංහිඳියාව, සිවිල් සමාජය )**

## විධායක සාරාංශය

පවතින මැතිවරණ නීති සහ රෙගුලාසි විමර්ශනය කිරීම සහ වෙනස්කම් නිර්දේශ කිරීම සඳහා ජනාධිපති වික්‍රමසිංහ විසින් විමර්ශන කොමිසමක් පත්කිරීමෙන් අනතුරුව පසුගිය සති කිහිපය තුළ මැතිවරණ සම්බන්ධයෙන් කරන ලද විවිධ ප්‍රකාශයන් මැතිවරණ කල් දැමීමක් පිළිබඳ පූර්ව අනුමාන ඇතිකිරීමට තුඩු දී තිබේ. 2024 නොවැම්බර් 24 වනදාට පෙරාතුව ජනාධිපතිවරණයක් පැවැත්වීම සම්බන්ධයෙන් වන රජයේ කැපවීම පිළිබඳ සැකය යන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා ජනමත විචාරණයක් පැවැත්වීමට රජය කල්පනා කරන බව ප්‍රකාශ කිරීමත් සමඟය. අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කර ඇති බව ප්‍රකාශ කිරීමත් මෙම කණස්සල්ලට හේතු වී තිබේ. 2017 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ පළාත් සභා මැතිවරණය අද දක්වා දින නියමයක් නොමැතිව කල් දැමීමට හේතු වූ යැයි කියන මැතිවරණ ප්‍රතිසංස්කරණවල ව්‍යසනය යළි ක්‍රියාත්මක වීමේ හැකියාව මැතිවරණයට මදක් පෙර ඇතිකරන මැතිවරණ ප්‍රතිසංස්කරණ මගින් ඉස්මතු කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩපිළිවෙල ආරක්ෂා කිරීම සඳහා මැතිවරණ අත්හිටුවීමක් අවශ්‍ය විය හැකි බවට ආණ්ඩුවේ සාමාජිකයින්ගේ අදහස්වලින් ප්‍රකාශ වේ. ආර්ථිකය වෙනුවෙන් පෙනීසිටින මුවාවෙන් මෙම විකල්පය තෝරා ගැනීමට රජය කැමැත්තෙන් සිටින බව පෙන්නුම් කර ඇත. සැප්තැම්බර් අගදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලබා දෙන ආධාරයේ දෙවන වාරිකය ලබා ගැනීමට ආණ්ඩුව අසමත් වීම, ආර්ථිකයේ අවිනිශ්චිත තත්ත්වය පිළිබඳ සිහිකැඳවීමකි. විශේෂයෙන්ම රජයේ ආදායම් උත්පාදනයේ ඇති විය හැකි හිඟයක් හේතුවෙන් අයවැය හිඟය අවම කර ගැනීම සම්බන්ධයෙන් රජය තමන් වෙත ලබා දී ඇති ආර්ථික ඉලක්ක සපුරා ගෙන නොමැති බව ද එහි සඳහන් කර තිබේ. කොන්ත්‍රාත්තු සහ ප්‍රසම්පාදන වෙබ් අඩවියේ පළ කිරීම, බදු විරාම සහ ප්‍රතිලාභ ලබන අය සඳහා එහි තාර්කිකත්වය පැහැදිලි කිරීම වැනි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපේක්ෂා කරන විනිවිද භාවයේ අවශ්‍යතා බොහොමයක් ඉටු කිරීමට රජය අසමත් වීම, ආර්ථික ප්‍රතිසංස්කරණ වෙනුවෙන් රජයේ කැපවීම පිළිබඳ විශ්වාසය බිඳවැටීමට හේතු වී තිබේ. සාමාන්‍ය ජනතාව අතර නොසන්සුන්තාව ඉහළ යාමත් සමඟ, සමාගමයේ සහ ප්‍රකාශනයේ නිදහස සීමා කරන නීති ගෙන ඒමේ සැලසුම් සමඟ ඉදිරියට යාමට රජය අදිටන් කරගෙන සිටින බවක් පෙනෙන්නට තිබුණි. ත්‍රස්ත විරෝධී පනත සහ අන්තර්ජාල ආරක්ෂණ පනත් කෙටුම්පත ජනතාවගේ නිදහසට බරපතල ලෙස බලපාන අතර රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ නීතියේ ආධිපත්‍යයට බරපතල බලපෑමක් ඇති කරනු ඇත. මෙම මර්දනකාරී නීතිවලට අමතරව රජය තවත් අලුත් නීති ගෙන එන්නේ ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය (ONUR) පනතයි. මෙම නීතිවලට පොදු දෙය නම් ඒවා පසුබිමේ තබාගෙන සිටින නාඳුනන පුද්ගලයින් විසින් විනිවිදභාවයකින් තොරව සකස් කර තිබීමයි. සිවිල් සමාජ කණ්ඩායම් විසින් මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් බරපතල ගැටළු දෙකක් සටහන් කර ඇති අතර එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර ඒවා සංශෝධනය කර නිසි මගට ගෙන ඒමට බහුතර කැමැත්ත භාවිතා කරන ලෙස රජයෙන් ඉල්ලා තිබේ. "ප්‍රජා මූලික සංවිධාන ඇතුළු ප්‍රාදේශීය සංවිධාන විසින් මෙහෙයවනු ලබන සාමය සහ

ප්‍රතිසන්ධාන වැඩසටහන් සඳහා මඟ පෙන්වීම සහ පහසුකම් සැලසීමේ" බලය මගින් සිවිල් සමාජයක් තුළ ගෞරවය දිනාගැනීමට ධහඹසෘ වෙත ලබා දී ඇති අධිකාරිය පිළිබඳව ඔවුන් සිය කණස්සල්ල පළ කර ඇත. පනත් කෙටුම්පතේ අනෙකුත් වගන්තිවල ධහඹසෘ විසින් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන සංහිඳියාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ සන්දර්භය තුළ පීඩාකාරී සහ ගැටලුකාරී විය හැකි සිවිල් සමාජයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය හා සමාලෝචනය කිරීමට ධහඹසෘ හට විෂය පථය ලබා දෙන විධි විධාන ඇතුලත්ව ඇත. අවධානය යොමු කළ යුතු දෙවන ක්ෂේත්‍රය වන්නේ ධහඹසෘ හි තීරණ ගැනීමේ ආයතනයේ පත් කිරීමේ ක්‍රියාවලියයි. වත්මන් නීති කෙටුම්පතට අනුව, ධහඹසෘ නායකත්වය දරන කමිටුවේ සාමාජිකයින් 11 දෙනා ධහඹසෘ විෂය පථය යටතේ එන අමාත්‍යවරයා විසින් තෝරාගෙන ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. මෙම තේරීම් ක්‍රියාවලියේ පවතින ඒකපාර්ශ්වික තීරණ ගැනීමේ හැකියාව සහ කමිටු සාමාජිකයන් පත් කිරීමේදී දේශපාලන පක්ෂග්‍රාහීත්වය ඇති කරයි. ධහඹසෘ පනත යටතේ තෝරාගත් සාමාජිකයින් 21 වැනි සංශෝධනයෙන් අපේක්ෂා කරන පරිදි පක්ෂග්‍රාහී නොවිය යුතුය.

## මැතිවරණ ක්‍රියාවලිය

මැතිවරණ කල්දැමීමට ඉඩ තිබේද යන ප්‍රශ්නය ජාතික දේශපාලනයේ කේන්ද්‍රස්ථානයට පැමිණියේ මේ කාලය තුළය. පවතින මැතිවරණ නීති රෙගුලාසි විමර්ශනය කිරීම සහ වෙනස්කම් නිර්දේශ කිරීම සඳහා ජනාධිපති වික්‍රමසිංහ විසින් විමර්ශන කොමිෂන් සභාවක් පත් කිරීම සාමාන්‍ය මහජනතාවගේ අවධානයට ලක්වන තුරු විනිවිදභාවයකින් තොරව සිදු විය. පවතින සියලුම මැතිවරණ නීති සහ රෙගුලාසි විමර්ශනය කර වත්මන් අවශ්‍යතාවලට සරිලන පරිදි නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම මෙම කොමිසමට පැවරී ඇත. එහි නියමු කොන්දේසිවලට අනුව කාන්තා හා තරුණ නියෝජනය වැඩි කිරීම, මුද්‍රිත ඡන්ද පත්‍රිකා වෙනුවට නවීන තාක්ෂණය භාවිත කරමින් විද්‍යුත් ඡන්දය භාවිත කිරීම හඳුන්වාදීම සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට පහසුකම් සැලසීම යන කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ. ඒවායින් සමහරක් ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ ඉහළින්ම නොතිබුණද මේවා ප්‍රතිසංස්කරණ සඳහා වලංගු ක්ෂේත්‍ර වේ. නමුත් කාලය පිළිබඳව සැලකිලිමත් වීම අවශ්‍ය වේ. ඒ, ජනාධිපති නීතිඥ සහ හිටපු අගවිනිසුරු ප්‍රියසාත් ඩෙප්ගේ ප්‍රධානත්වයෙන් යුතු මෙම කොමිෂන් සභාවේ බලතල වන්නේ පවතින සියලුම මැතිවරණ නීති සහ රෙගුලාසි, "වර්තමාන අවශ්‍යතාවලට ගැලපෙන පරිදි" පරීක්ෂා කර ඒවා සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමයි. කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, මැතිවරණ නිසි ලෙස පැවැත්වීම සඳහා මාධ්‍යවලට සහ දේශපාලන පක්ෂවලට මාර්ගෝපදේශ නිකුත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව (ැක) දැනටමත් නියම කර ඇත. එය සිදු කොට ඇත්තේ පාර්ලිමේන්තුවේ පිළිගත් දේශපාලන පක්ෂවලින් පවා කිසිදු පූර්ව උපදේශනයකින් තොරවය. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරණයට මාස 11ක් පමණක් ඉතිරිව තිබියදී ලබන වසරේ (2024) සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ පැවැත්වීමට නියමිත මැතිවරණයක් සඳහා මෙම මාර්ගෝපදේශන නිකුත් කිරීම රටේ මැතිවරණ ක්‍රියාවලිය ඇනහිටීමේ අරමුණකින් සිදු කළ දෙයක් විය හැකි බවට සැකයක් පවතී. පළාත් පාලන මැතිවරණ සහ පළාත් සභා මැතිවරණ කල් යන සන්දර්භය තුළ මෙම සැකයන් තීව්‍ර වේ.
https($$www'themorning'lk$articles$N9Z3OsoekTniRKiuXH8n

කෙසේ වෙතත්, එක්සත් ජාතික පක්ෂයේ නායක ජනාධිපති වික්‍රමසිංහ එක්සත් ජාතික පක්ෂයේ ජාතික සමුළුව අමතමින් 2024 ජනාධිපතිවරණයෙන් පසුව පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට නියමිත බව ප්‍රකාශ කොට සිටියේය. පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට අපේක්ෂා කරන්නේ 2025 මුල් භාගයේදී පමණක් බවට ඔහු කළ ප්‍රකාශය මැතිවරණ කාලසටහන කෙරෙහි ඔහු පෙන්නුම් කරන කැපවීම බිඳ වැටීමට හේතු විය. මක්නිසාද යත් පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුව තිබුණේ මාර්තු මාසයේදී මිස නීතියට පටහැනිව වසර දෙකකින් එළඹෙන අනාගතයේ නොවන බැවිනි. නීත්‍යානුකූල ප්‍රතිපාදනවලට අනුකූලව සහ ස්වාධීනත්වය මැනවින් ප්‍රදර්ශනය කරමින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා පැවසුවේ 2024 දී , ජනාධිපතිවරණ, පළාත්සභා සහ පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීම සඳහා මුදල් වෙන් කරන ලෙස ඔවුන් භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇති බවයි. "ශ්‍රී ලංකාවේ මැතිවරණ සඳහා දින නියමයක් කොට නොමැත. අවුරුදු ගාණකින් පළාත් සභා නොපැවැත්වුණත් බලය තියෙන අයට ඕන වෙලාවක පළාත් සභා තියන්න පුළුවන්. ඉතින් පහුගිය අවුරුදු කිහිපයේ අයවැයක් හදනකොට භාණ්ඩාගාරයෙන් ඇස්තමේන්තුවක් දෙන්න කියලා ඉල්ලනකොට අපි හැම වෙලාවෙම පළාත් සභා මැතිවරණය පවත්වන්න මුදල් ඉල්ලනවා. අපි මේ මැතිවරණ සඳහා රුපියල් බිලියන 30ක් ඉල්ලා තිබෙනවා. මහ මැතිවරණයකට රුපියල් බිලියන 11ක් වැය වන

බව අපි මහා භාණ්ඩාගාරයටත් කියා තිබෙනවා. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හැරියොත් අපට මුදල් ලබාදීමට ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බැඳී සිටිනවා" යැයි හෙතෙම පැවසීය.
https($$island'lk$ec-seeks-rs-30-bn-for-polls-next-year$

## ආණ්ඩු ප්‍රතිසංස්කරණ

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩපිලිවෙල ආරක්ෂා කිරීම සඳහා මැතිවරණ අත්හිටුවීමක් අවශ්‍ය විය හැකි බවට ආන්ඩුවේ සාමාජිකයින් විසින් ප්‍රකාශ කරන ලද අදහස්වලින් පෙනී යයි. ආර්ථිකය වෙනුවෙන් පෙනීසිටින මුවාවෙන් මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමට රජය කැමැත්තෙන් සිටින බව පෙනී යයි. 2024 නොවැම්බර් 24 වනදාට පෙරාතුව ජනාධිපතිවරණයක් පැවැත්වීම සම්බන්ධයෙන් වන රජයේ කැපවීම පිලිබඳ සැකය යන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා ජනමත විචාරණයක් පැවැත්වීමට රජය කල්පනා කරන බව ප්‍රකාශ කිරීමත් සමඟය. අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කර ඇති බව ප්‍රකාශ කිරීමත් මෙම කනස්සල්ලට හේතු වී තිබේ. මෙම කැබිනට් පත්‍රිකාව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුද යන්න සහ විධායක අගමැතිවරයකු සමඟ පාර්ලිමේන්තුව තවදුරටත් ශක්තිමත් කළ යුතුද යන්න සොයා බැලීම සඳහා මහජන ජනමත විචාරණයක් කැඳවීමට තුඩු දිය හැකි පියවරෙහි කොටසකි. පසුගිය දශක තුනක කාලය තුළ මෙම ආයතනය අහෝසි කිරීමට යෝජනා ඉදිරිපත් වුයේ එම තනතුරට තරග වදින්නන් තමන් තේරී පත්වූ පසු ජනාධිපති ධුරය අහෝසි කරන බවට ප්‍රතිඥා දෙමිනි. ජනාධිපති ක්‍රමයේ මූලික ප්‍රශ්නය තනි පුද්ගලයකු අතට බලය ඒකරාශී වීමය. මෙම අවස්ථාවේදී, නව හේතුවක් ඉදිරිපත් වී ඇත. එම ගැටලුව වන්නේ දැනට වාර්තා වන පරිදි ලබන වසරේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේ කිසිදු අපේක්ෂකයෙකු පළමු වටයේදීම ජනාධිපති ධුරයට පත්වීම සඳහා සියයට 50 සීමාව ලබා නොගැනීමයි. ලබන වසරේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයට පෙර විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ සාධාරණීකරණය කිරීමට හේතුව වන්නේ කිසිදු අපේක්ෂකයෙකුට හෝ දේශපාලන පක්ෂයකට මැතිවරණයෙන් සියයට 50කට වැඩි ජයග්‍රහණයක් ලබා ගැනීමට නොහැකි වීමයි. කෙසේ වෙතත්, බොහෝ ප්‍රධාන දේශපාලන පක්ෂ එවැනි පියවරයන් පිළිබඳව සැලවීමෙන් පසු ප්‍රකාශ කර ඇත්තේ එවැනි පියවරක් පාර්ලිමේන්තුවේදී මතු කරන විට තම විරෝධය පළ කරන බවයි.

මෙම දුර්වල පදනම මත ජනාධිපති ධුරය අහෝසි කිරීමේ යෝජනාවට අමතරව මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමටද සැලසුම් කර තිබේ. සරල බහුතර ක්පාරමය යටතේ මන්ත්‍රීවරුන් 160ක් පාර්ලිමේන්තුවට තෝරා පත් කර ගැනීමට මෙම ප්‍රතිසංස්කරණ තුලින් අපේක්ෂා කරන බව අධිකරණ අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා පැවසීය. ආසන 225කින් යුත් පාර්ලිමේන්තුවකින් ඉතිරි මන්ත්‍රීවරුන් 65 දෙනා සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ ඡන්දදායකයින් සංඛ්‍යාව අනුව ජාතික ලැයිස්තුවෙන් සහ දිස්ත්‍රික් ලැයිස්තුවෙන් නියෝජනය වේ. මෙම යෝජනා දෙකම අතිවිශාල ගැටළු සහිත වේ. 2000 දී සහ 2015 දී සිදු වූ පරිදි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ ක්‍රමානුකූල ප්‍රයත්නයේ කොටසක් ලෙස, ඔවුන් පසුගිය කාලය තුළ තනි තනිව සහ ඒකාබද්ධව සහ තාවකාලික ක්‍රම මගින් අත්හදා බලා ඇත. නමුත් සෑම අවස්ථාවකදීම ඒ සඳහා විරෝධතා මතු විය. විවිධ දේශපාලන පක්ෂ සහ බලපෑම් කණ්ඩායම්වල අභියෝග හේතුවෙන් මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඇණහිට ඇත. 2017 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ පළාත් සභා මැතිවරණය අද දක්වා දින නියමයක් නොමැතිව කල් දැමීමට හේතු වූ ව්‍යසනය යළි ක්‍රියාත්මක වීමේ හැකියාව මැතිවරණයට ආසන්නව සිදු කරන මැතිවරණ ප්‍රතිසංස්කරණ මගින් ඉස්මතු කරයි. එමඅවස්ථාවේදී මැතිවරණ පැවැත්වීමට නියමිතව දිනට ආසන්නව කාන්තා කෝටාවක් ගෙන ඒම ඇතුළු මැතිවරණ නීතියට ධනාත්මක ප්‍රතිසංස්කරණ කිහිපයක් හඳුන්වා දීමට රජය යෝජනා කළේය. එහෙත් පැවති නීතිය යටතේ පළාත් සභා මැතිවරණය අවලංගු කළ පසු, මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට රජය අසමත් විය. මේ නිසා එදා සිටම පළාත් සභා අස්ථාවර තත්ත්වයකට පත් විය. පාර්ලිමේන්තුවේ දී ද එවැනිම තත්ත්වයක් උද්ගත වීම රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ඇතිවන ඛේදවාචකයක් වනු ඇත, මන්ද එයට තේරී පත් වූ ජනාධිපතිවරයකු, පාර්ලිමේන්තුවක්, පළාත් සභා හෝ පළාත් පාලන අධිකාරියක් නොමැති බැවිනි. ඒ වෙනුවට එය කල් ඉකුත් වූ ජනවරම සහිත රජයේ නායකයින්ගෙන් සමන්විත වුවක් වනු ඇත.

## පක්ෂ මාරු කරන මන්ත්‍රීවරුන්ට පර්ලිමේන්තුවේ ආසන අහිමි වීමට ඉඩ තිබේ.

ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ (SLMC) හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ අමාත්‍ය නසීර් අහමඩ් මහතා ආණ්ඩුවට පැනීම නිසා පක්ෂයෙන් නෙරපා හැරීමේ තීරණය තහවුරු කළ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ දේශපාලනඥයන් අතර කම්පනයක් ඇති කිරීමට හේතු වී තිබේ. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය පක්ෂයෙන් නෙරපා හැරීමට ගත් තීරණය අභියෝගයට ලක් කරමින් අහමඩ් ගොනු කළ පෙත්සමකට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය සිය තීන්දුව ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ තීරණය වලංගු සහ නීත්‍යානුකූල බවයි. ශ්‍රේෂ්ඨාධිකරණය නසීර් අහමඩ්ගේ තනතුරු ඉවත් කළේ ඔහුගේ පියවර නැවත ගැනීමට ප්‍රමාණවත් අවස්ථාවක් ලබා දී තිබියදීත්, පාර්ලිමේන්තු ඡන්දය සම්බන්ධයෙන් තම පක්ෂයේ ප්‍රකාශිත නීති නැවත නැවතත් කඩ කළ බව පවසමිනි. මෙම තීන්දුව රටේ නීතියට අනුව නිවැරදි ප්‍රවේශයක් ලෙස පුළුල් පැසසුමට ලක්ව ඇත. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මහලේකම් නිසාම් කාරියප්පර් පැවසුවේ, දේශපාලන හිතවත්කම්වල ශුද්ධවත්භාවය රැක ගනිමින්, පුද්ගලික වාසි තකා පක්ෂ මාරු කිරීමට කල්පනා කරන දේශපාලනඥයන්ට එය බරපතල සිහිකැඳවීමක් වනු ඇතැයි තමන් විශ්වාස කරන බවයි. "ඇමති ධුරය ලබා ගැනීම දියාරු කරමින් ඔහුව ධුරයෙන් නෙරපා හරින ලද මගේ ලිපිය වලංගු කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුව එය අමාත්‍ය ධුර සඳහා පක්ෂ වෙනස්වීම් සලකා බලන අයට ප්‍රමුඛ බාධාවක් ලෙස කැපී පෙනේ," කාරියප්පර් පැවසීය. දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ.සුමන්තිරන් ජනාධිපති නීතිඥ කාරියපර්ගේ අදහස් ප්‍රතිරාවය කළේය. ඓතිහාසික සන්දර්භය තුළ එහි අදාළත්වය අවධාරනය කරමින් විනිසුරුවරුන්ගේ ඒකමතික එකඟතාවය ඔහු අගය කරමින් ඔහු ප්‍රකාශ කළේ "වසර ගණනාවක් තිස්සේ මේ හා සමාන නඩු සඳහා ප්‍රශ්නකාරී පාර්ශවයට හිතැති අන්දමින් නඩු තීන්දු ලබා දීමට කටයුතු කර තිබූ හෙයින් මෙය ඉතා සැලකිය යුතු තීන්දුවක් බවයි".
https($$bnn'network$politics$sc-determines-minister-ahameds-expulsion-from-slmc-valid$

## ආර්ථික ප්‍රකෘතිමත් වීම

සැප්තැම්බර් අගදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ලබා දෙන ආධාරයේ දෙවන වාරිකය ලබා ගැනීමට ආණ්ඩුව අසමත් වීම, ආර්ථිකයේ අවිනිශ්චිත තත්ත්වය පිළිබඳ සිහි කැඳවීමක් විය. විශේෂයෙන්ම රජයේ ආදායම් උත්පාදනයේ ඇති විය හැකි හිඟයක් හේතුවෙන් අයවැය හිඟය අවම කර ගැනීම සම්බන්ධයෙන් රජය තමන් වෙත ලබා දී ඇති ආර්ථික ඉලක්ක සපුරා ගෙන නොමැති බව ද එහි සඳහන් කර තිබේ. ඔයෑ කොන්ත්‍රාත්තු සහ ප්‍රසම්පාදන වෙබ් අඩවියේ පළ කිරීම, බදු විරාම සහ ප්‍රතිලාභ ලබන අය සඳහා එහි තාර්කිකත්වය පැහැදිලි කිරීම වැනි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපේක්ෂා කරන විනිවිද භාවයේ අවශ්‍යතා බොහොමයක් ඉටු කිරීමට රජය අසමත් වීම, ආර්ථික ප්‍රතිසංස්කරණ වෙනුවෙන් රජයේ කැපවීම පිළිබඳ විශ්වාසය බිඳවැටීමට හේතු වී තිබේරාජ්‍ය ක්‍රියාකාරකම් හරහා සිදුවන ආයතනික දුර්වලතා සහ ගැඹුරට මුල් බැසගත් දූෂණ අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා ඡළ්‍ය විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෑතකදී නිකුත් කරන ලද විශ්ලේෂණ තක්සේරු වාර්තාවේ (GDA) හි ප්‍රමුඛතා ක්‍රියාමාර්ග දහසයක් නිර්දේශ කර ඇත. ඡළ්‍ය සඳහන් කළේ, "පසුගිය සතියේ නිකුත් කරන ලද තාක්ෂණික සහය වාර්තාවෙන් හෙළිදරව් වූයේ පුලුල්ව පැතිරුනු දූෂණ අවදානම් සහ පාලන දුර්වලතා, තාවකාලික බදු ප්‍රතිපත්ති භාවිතයන්, මුදල් විශුද්ධිකරණයට එරෙහි/ මූල්‍ය ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සඳහා වන (AML/CFT), ශක්තිමත් නෛතික රාමුවක් නොමැති වීම සහ SOE වල භාවිතා වන දුර්වල ක්‍රියාවලීන්, පොදු ප්‍රසම්පාදන නීති නොමැති වීම යනාදිය දුර්වලතා ලෙස හඳුනාගෙන ඇති බවයි."

එහි දෙවන වාරිකය ලබා දීම ප්‍රමාද කිරීමේදී, IMF රජයට දන්වා සිටියේ රජය තම වගකීම් ඉටු කිරීම පෙන්නුම් කරන ආකාරයට ප්‍රමාණවත් අන්දමේ ආදායමක් රැස් නොකරන බවයි. ඍජු සහ වක්‍ර බදු යන දෙකෙන්ම දැනටමත් තම සීමාව ඉක්මවා මිරිකී සිටින ජනයා තව තවත් පීඩනයට ලක්වනු ඇත. දැන් බදු ගෙවන බහුතරයක් බදු වැඩි කිරීමට පෙර යන්තම් හෝ තම වියදම් පියවා ගැනීමට නොහැකි වූ පිරිසකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඔවුන් ඉලක්ක කරන්නේ ඔවුන්ගේ වැඩි බදු අය කරගැනීම සඳහා නොවන බව පෙනේ. ගැටලුව වන්නේ රජය ජනගහනයේ ධනවත්ම අංශවලින් විශාල ප්‍රමාණයකට බදු අය නොකිරීම සහ දූෂණයට හා බදු වංචාවලට තිත තැබීමට කටයුතු නොකිරීමයි. මේවාට බැංකු සහ මහාපරිමාණ ලියාපදිංචි ව්‍යාපාර පමණක් නොව දේශපාලනඥයන්, කොමිස් නියෝජිතයන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ ලියාපදිංචි නොකළ

ව්‍යාපාර ද ඇතුළත් වේ. මේ වන විට රජය තුළ පාලනය කළ නොහැකි දූෂණ ඉහළ මට්ටමක පවතින බව පෙන්නුම් කරන දර්ශකයක් සෞඛ්‍ය පද්ධතියේ අර්බුදය තුළින් දැකිය හැකිය. සීමිත විනිවිදභාවය, ඇතුළත් සහ සහභාගීත්ව පාලනය සඳහා වේදිකා නොමැතිකම සහ ත්‍රස්ත විරෝධී නීති පුළුල් ලෙස භාවිතා කිරීම මගින් සීමා කර ඇති රජයේ ක්‍රියාමාර්ග අධීක්ෂණය සහ අධීක්ෂණය සඳහා වඩාත් විධිමත් සිවිල් සමාජ සහභාගීත්වය සඳහා ඡන්ද ඉල්ලා ඇත.

## ප්‍රජාතන්ත්‍රවිරෝධී නීති

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (ඩ්‍යකසෂ) ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සලකා බලමින් පවතින සංශෝධිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත හරහා බලධාරීන්ට පුළුල් බලතල රැසක් ලබා දෙන ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට අනුකූලව නොව මානව හිමිකම්වලට සීමා පනවන අන්දමේ ඒවා බවත් ඒ පිළිබඳව ඔවුන් දැඩි අවධානයක් යොමු කරන බවයි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්ගේ නිල ප්‍රකාශක රවීනා ෂාම්දාසානි පැවසුවේ ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් යාන්ත්‍රණය දිගු කලක් තිස්සේ අවධානය යොමු කොට තිබෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රතිස්ථාපනය කිරීමට අදහස් කරන බවයි. " දඬුවම් ලෙස මරණීය දණ්ඩනය ලබා දීම ඉවත් කිරීම ඇතුළුව කෙටුම්පතේ ධනාත්මක සංශෝධන කිහිපයක් සිදු කර ඇති අතර, සංශෝධිත කෙටුම්පතේ බොහෝ විධිවිධානවල විෂය පථය සහ වෙනස් කොට සැලකීමේ බලපෑම් පිළිබඳව තවමත් ප්‍රධාන උත්සහයන් පවතී." ප්‍රකාශනයේ නිදහසට සහ සාමකාමීව රැස්වීමට ඇති අයිතිවාසිකම්වලට ඇති කරන සීමා කිරීම් සමානුපාතික අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීමට බොහෝ දුරට ඉඩ තිබේ. මෙම පනත් කෙටුම්පත තුළ ත්‍රස්තවාදය පිළිබඳ ඕනෑවට වඩා පුළුල් නිර්වචනයක් ඇතුළත් වන අතර ප්‍රමාණවත් අධිකරණ අධීක්ෂණයකින් තොරව පුද්ගලයන් නැවැත්වීමට, ප්‍රශ්න කිරීමට සහ සෙවීමට සහ අත්අඩංගුවට ගැනීමට සහ රඳවා තබා ගැනීමට පොලිසියට සහ හමුදාවට පුළුල් බලතල ලබා දෙයි. ඇඳිරි නීතිය පැනවීම, සීමා කිරීම් නියෝග සහ තහනම් ස්ථාන නම් කිරීම සම්බන්ධයෙන් අනෙකුත් ප්‍රශ්න ඉතිරිව ඇති අතර, ප්‍රමාණවත් සංවරණයෙන් සහ තුලනයෙන් තොරව විධායකයට ලබා දී ඇති බලතලවල විෂය පථය පිළිබඳ කනස්සල්ල මතු කරයි. මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත සම්බන්ධයෙන්, මහජනයාගේ මාර්ගගත සන්නිවේදනය දැඩි ලෙස නියාමනය කර සීමා කරනු ඇතැයි අපි විශ්වාස කරන අතර, ඔවුන් එකඟ නොවන ප්‍රකාශන "අසත්‍ය ප්‍රකාශ" ලෙස ලේබල් කිරීමට සහ සීමා කිරීමට බලධාරීන්ට ඒ හරහා අසීමිත අභිමතය ලබා දෙනු ඇත. පනත් කෙටුම්පතේ බොහෝ වගන්තිවල අපැහැදිලි ලෙස අර්ථ දක්වා ඇති නියමයන් සහ වැරදි පිළිබඳ නිර්වචන අඩංගු වන අතර එමගින් අත්තනෝමතික හා ආත්මීය අර්ථකථනය සඳහා සැලකිය යුතු ඉඩක් ඉතිරි කර ඇත. ප්‍රකාශනයේ නිදහස කෙරෙහි සියුම් බලපෑමක් ඇති කරන පරිසරයක් නිර්මාණය කරමින් නීත්‍යානුකූල ප්‍රකාශනයේ සෑම ආකාරයක්ම පාහේ අපරාධබවට එමගින් පත් කළ කළ හැකි විය හැකිය. ඇය ප්‍රකාශ කර සිටියේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට පූර්ණ අනුකූලතාව ගෙන ඒම සඳහා සිවිල් සමාජය සහ එක්සත් ජාතීන්ගේ ස්වාධීන විශේෂඥයින් සමඟ තවදුරටත් අර්ථවත් උපදේශන කටයුතු සිදු කරන ලෙසත් නීති කෙටුම්පත් සැලකිය යුතු ලෙස සංශෝධනය කරන ලෙසත් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලය රජයෙන් ඉල්ලා සිටින බවයි.

https($$www'dailymirror'lk$breaking-news$OHCHR-concerned-about-Anti-Terrorism-Bill-Online-Safety-Bill$108-269172

දේශපාලන පක්ෂ, සිවිල් සමාජය සහ ජාත්‍යන්තර මානව හිමිකම් කණ්ඩායම්වල විරෝධතා නොතකා, සමාගමයේ සහ ප්‍රකාශනයේ නිදහස සීමා කරන නීති ගෙන ඒමේ සැලසුම් සමඟ ඉදිරියට යාමට රජය අදිටන් කරගෙන සිටින බවක් පෙනෙන්නට තිබුණි. ත්‍රස්ත මර්දන පනත් කෙටුම්පත සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත ජනතාවගේ නිදහසට හා ස්වාධීනත්වයට දැඩි ලෙස බලපාන බවත් එය රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ නීතියේ ආධිපත්‍යයට බරපතළ ලෙස බලපාන බවත් ඒවා ඉවත් කර ගන්නා ලෙසත් නීතිඥ සංගමය ඉල්ලා සිටී. මේ පනත් පාර්ලිමේන්තුව හරහා සම්මත වුවහොත් ආණ්ඩුව වැරදි මගක ගමන්අ කළහොත් එය අභියෝගයට ලක්කිරීමට අපහසු වේ. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට හානි වන වගන්ති ඇත. යෝජිත පනත් කෙටුම්පත "කරුණු ප්‍රකාශය" වැනි පුළුල් හා නොපැහැදිලි අර්ථ දැක්වීමකින් සමන්විත වන අතර එහි නිර්වචනය තීරණය

කරන්නේ කවුරුන්ද යන්න පැහැදිලි නැත. තවද, විධායකය විසින් පත් කරන ලද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසමට නිවේදන නිකුත් කිරීමේ බලය සහ අසත්‍ය ප්‍රකාශ පැතිරීම නැවැත්වීමේ හැකියාව ඇත. මෙය "අසත්‍ය ප්‍රකාශය" යන යෙදුම අනිසි ලෙස භාවිතා කිරීම සහ එහි අර්ථ නිරූපණය පිළිබඳ උත්සුකයන් ඉස්මතු කරයි. එක්සත් ජනපද තානාපතිනි ජූලී චන්ග් පැවසුවේ සාමකාමී විරෝධතාවයකින්, කලාව හරහා කරන ප්‍රකාශනය කිරීමෙන් හෝ සමාජ මාධ්‍ය හරහා ප්‍රකාශනය කිරීමේ නිදහසේ වටිනාකම් කැපකිරීමෙන් ස්ථාවරත්වය ඇතිකරගත යුතු නැති බවයි. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 45ක් ගොනු කර තිබුණි. සැලකිය යුතු සිද්ධීන් සංඛ්‍යාවක් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතට එරෙහිව සැලකිය යුතු සංඛ්‍යාවක පෙත්සම් ගොනු වීම ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු මහජන උනන්දුවක් හෝ සැලකිල්ලක් පවතින බව පෙන්නුම් කරයි. මෙම පනත් කෙටුම්පතට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ පෙත්සම්කරුවන් අතර කොළඹ අගරදගුරු කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් ද විය.
https($$www'dailymirror'lk$breaking-news$Stability-should-not-come-at-the-sacrifice-of-values-of-freedom-of-expression-U-S-Ambassador$108-267816

කෙසේ වෙතත්, ත්‍රස්තවාදයට එරෙහි පනත් කෙටුම්පත සම්බන්ධයෙන් රජය නැවත වරක් කල්පනා කරන බවක් පෙනෙන්නට තිබේ. ත්‍රස්තවාදය විරෝධී පනත් කෙටුම්පතට එරෙහි සියලු පෙත්සම් විභාග කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අත්හිටුවා තිබේ. අගවිනිසුරු ජයන්ත ජයසූරිය ප්‍රමුඛ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල ප්‍රකාශ කළේ අදාළ පනත් කෙටුම්පත මෙතෙක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොමැති බව කථානායකවරයා තහවුරු කර ඇති බැවින් ඒ පිළිබඳ විභාගයක් අධිකරණයට පැවැත්විය නොහැකි බවයි. රජය සතුව පවතින නීතිය වන ඒ හා සමානව කුරිරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත එහි උපස්ථම්භය ලෙස ඇති බැවින් ATA ඉවත් කර ගැනීමට රජය උපායශීලීව කටයුතු කරන බව පෙනේ.

## සංහිඳියාව

ආණ්ඩුව නව නීති රැසක් ගෙන එමින් තිබෙන අතර එහි නවතම නීතිය වන්නේ ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය (ONUR) පනතයි. මෙම නීතිවලට පොදු දෙය නම් ඒවා පසුබිමේ තබාගෙන සිටින නාඳුනන පුද්ගලයින් විසින් විනිවිදභාවයකින් තොරව සකස් කර තිබීමයි. ONUR පනත ජනවාර්ගික, ආගමික සහ සමාජීය සහජීවන ගැටළු ඇතුළත් පුළුල් එකකි. රට තුළ ජාතික සමගිය, සංහිඳියාව සහ කල් පවත්නා සාමය ඇති කිරීම සඳහා රජයට සහ අදාළ බලධාරීන්ට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමටත්, සංහිඳියාව සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමටත් පිහිටුවනු ලබන කාර්යාලයට බල කෙරෙනු ඇත. එමගින් සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් යුත් කාර්යාලයක් පිහිටුවීමට යෝජනා කරයි. මෙම කාර්යාලය අමාත්‍යාංශයක අතිරේක ලේකම්වරයෙකුගේ නිලයට නොඅඩු නිලතල දරන එක් සාමාජිකයෙකුගෙන් සහ අමාත්‍යවරුන්ගේ නිර්දේශ මත තවත් දස දෙනෙකුගෙන් සමන්විත වේ. සියලුම සාමාජිකයන් පත් කළ යුත්තේ ජනාධිපතිවරයා විසිනි. නව කාර්යාලයට සැලකිය යුතු අන්දමේ බලතල කොටසක් ලබා දී ඇත.

සිවිල් සමාජ කණ්ඩායම් විසින් මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් බරපතල ගැටළු දෙකක් සටහන් කර ඇති අතර එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර ඒවා සංශෝධනය කර තමන්ගේම මාර්ගයක් ලබා ගැනීමට බහුතරය භාවිතා කරන ලෙස රජයෙන් ඉල්ලා සිටී. "ප්‍රජා මූලික සංවිධාන ඇතුළු ප්‍රාදේශීය සංවිධාන විසින් මෙහෙයවනු ලබන සාමය සහ ප්‍රතිසන්ධාන වැඩසටහන් සඳහා මඟ පෙන්වීම සහ පහසුකම් සැලසීමේ" බලය මගින් සිවිල් සමාජයක් තුළ නිර්දේශිත වීමට ONUR වෙත ලබා දී ඇති කාර්යභාරය පිළිබඳව ඔවුන් සිය කනස්සල්ල පළ කර ඇත. පනත් කෙටුම්පතේ අනෙකුත් වගන්තිවල ONUR විසින් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන සංහිඳියාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ සන්දර්භය තුළ පීඩාකාරී සහ ගැටළුවක් විය හැකි සිවිල් සමාජයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය හා සමාලෝචනය කිරීමට ONUR හට විෂය පථය ලබා දෙන විධිවිධාන ඇත. . අවධානය යොමු කළ යුතු දෙවන ක්ෂේත්‍රය වන්නේ ONUR හි තීරණ ගැනීමේ ආයතනයේ පත් කිරීමේ ක්‍රියාවලියයි. වත්මන් නීති කෙටුම්පතට අනුව, ONUR නායකත්වය දරන කමිටුවේ සාමාජිකයින් 11 දෙනා ONUR විෂය පථය යටතේ එන අමාත්‍යවරයා විසින් තෝරාගෙන ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. 21 වැනි සංශෝධනය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සිදු කරන ලද පත්වීම් වළක්වාලීමට අදහස් කළ කමිටු සාමාජිකයන් පත් කිරීමේදී ඒකපාර්ශ්වික තීරණ ගැනීමේ සහ

දේශපාලන පක්ෂග්‍රාහී වීමේ හැකියාව තෝරා ගැනීමේ ක්‍රියාවලිය මගින් නිර්මාණය කරයි. ධහඹසෘ පනත යටතේ තෝරාගත් සාමාජිකයින් 21 වැනි සංශෝධනයෙන් අපේක්ෂා කරන පරිදි පක්ෂග්‍රාහී නොවිය යුතුය. යෝජිත ධහඹසෘ කාර්යාලය මෑතකාලීනව නිර්මාණය වෙමින් පවතින නව ආයතනවල ප්‍රධානීන් ජනාධිපතිවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි පත් කිරීමට නියමිත රටාව අනුගමනය කිරීම විශේෂත්වයකි.

අනාගතයේදී උද්වේගකර විය හැකි ගැටුම් ඇති ක්ෂේත්‍ර දෙකක් පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතුය. මෙම අවස්ථා දෙකේදීම බහුතර ප්‍රජාවේ සාමාජිකයින් විසින් නැගෙනහිර තෘණ බිම් වැනි වාර්ගික සුළුතර ප්‍රජාවන්ගේ සංරක්ෂණ ප්‍රදේශ ලෙස සම්ප්‍රදායිකව පෙනෙන ප්‍රදේශවලට ඇතුළු වීමට උත්සාහ කර ඇත. දෙමළ සහ මුස්ලිම් ගොවීන්ට ස්ථිර නීත්‍යානුකූල හිමිකම් නොමැති මෙම රජයට අයත් ඉඩම් ඔවුන්ගේ පවුල් තිබෙන ස්ථාන සමඟ සිංහල ගොවීන්ට පැවරීමට සූදානමක් පවතී. මෙම  ප්‍රශ්නය ආගමික අන්තවාදයේ දිසාවට ගෙනයාම සිදුවනුයේ පසුගිය කාලයේ හින්දු  පූජනීය ස්ථානවල බෞද්ධ ප්‍රතිමා තැන්පත් කිරීමට ගෙන යාමෙනි. නමුත් සමහර අවස්ථාවල මීට වසර සිය ගණනකට පෙර හින්දු ආගමික ස්ථාන පැවතීම ඊට පෙරාතුව විය. මෙම ගැටුමේ තීව්‍රතාවය අවම කිරීමට විශාල සෝෂාවක් නඟමින් "පාළුකරයේ හඬකට " සමාන වූ  නියෝග ජනාධිපතිවරයා නිකුත් කර ඇතත්, නමුත් ඉන් පසු කිසිදු පසු විපරම් ක්‍රියාමාර්ගයක් නොගැනීම අවාසනාවන්ත තත්ත්වයකි.

## සිවිල් සමාජය

ශ්‍රී ලංකාව පිළිබඳ සිවිල් සමාජ පාලනය පිළිබඳ විශ්ලේෂණ  වාර්තාවී ඉහළ පෙළේ අන්දමින් එළිදැක්වීම සැප්තැම්බර් 13 වැනි බදාදා කොළඹ ර්ඵෂකා හිදී සිදු විය. මෙම අවස්ථාවට ප්‍රතිපත්ති සම්පාදකයින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ඡඵත) නියෝජිතයින්, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල, ජාත්‍යන්තර අරමුදල් ආයතන, සිවිල් සමාජ සංවිධාන, විද්වතුන් සහ වෙනත් විවිධ ක්ෂේත්‍රවල සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වය දක්නට ලැබුණි. ශ්‍රී ලංකාවේ ප්‍රතිසංස්කරණවල තීරණාත්මක සමාජ-දේශපාලන අවස්ථාව පිළිබිඹු කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ක්‍රියාමාර්ගය (පැෆ්රල්) සහ ජාතික සාම සභාව (හජක) මෙම සහයෝගීතා ප්‍රයත්නය මෙහෙයවනු ලැබුවේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (ඔෂීඛ) විසින් ඪැරසඵඞී ඍැි්රජය, ප්‍රතිපත්ති විකල්ප මධ්‍යස්ථානය (CPA), සර්වෝදය, මහජනතාවගේ මධ්‍යස්ථානයෙන් සමන්විත මූලික කණ්ඩායමක් සමඟ සහයෝගයෙන් ය.  ඔවුන් එක්ව "ආර්ථික ප්‍රකෘතිය සඳහා දූෂණ විරෝධී ප්‍රතිසංස්කරණ පිළිබඳ සිවිල් සමාජ මුලපිරීම" පිහිටුවා ගත් අතර, රටේ ගැඹුරට මුල් බැසගත් දූෂණයෙන් ගිලී ඇති පාලන අර්බුදයක සිටින බවට පොදු අවබෝධයක් ඇතිව එය විසඳීම සඳහා , අප සත්‍ය වශයෙන්ම තිරසාර හා සාධාරණ ආර්ථික ප්‍රකෘතියක්  සඳහා උත්සාහ ගත යුතුය. විශ්ලේෂණ වාර්තාව ජාතියේ වත්මන් අර්බුදයට මූලික හේතු විසඳීම සඳහා නිර්මාණය කර ඇති පුළුල් ආණ්ඩු ප්‍රතිසංස්කරණ නිර්දේශ මාලාවක් හඳුන්වා දෙන ලදී. විවිධ අංශ, භූගෝලීය ස්ථාන, වාර්ගික, ආගමික සහ සංස්කෘතික කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගිවන්නන් 250 කට අධික සංඛ්‍යාවක් විසින් සපයන ලද තොරතුරුවලින් වාර්තාව ප්‍රතිලාභ ලබා ඇත. මහාචාර්ය අර්ජුන පරාක්‍රම මහතා සිවිල් සමාජ මුලපිරීම සඳහා පර්යේෂණ සිදු කළේය. ශ්‍රී ලංකාව තුළ භාවිතා වන ඉහළ සම්භාවිතා සහ අධි අවදානම් උපක්‍රම අතර රටේ වගවීමේ රාමුව ව්‍යුහාත්මකව දුර්වල කිරීම, රාජ්‍ය නිලධාරීන්ට බලපෑම් සහ  සහ නීති විරෝධී මූල්‍ය ගනුදෙනු භාවිතය, ඇඟිලි ගැසීම්, රාජ්‍ය ව්‍යවසාය අවභාවිත කිරීම, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි හැසිරවීම, යටපත් කිරීම බව වාර්තාව අනාවරණය කරයි.

## PAFFREL LGBTIQ+ ප්‍රජාවගේ අයිතිවාසිකම්  සම්බන්ධයෙන් මූලිකත්වය ගනී.

පැෆ්රල් සංවිධානය මැතිවරණ කොමිෂන් සභාව සමඟ එක්ව ප්‍රජා නියෝජිත සංවිධාන සමඟ සාකච්ඡාවක් ඔක්තෝබර් 6 වැනිදා කොළඹදී සංවිධානය කළේය. ඇතැම් ප්‍රජාවන් ඔවුන්ගේ ඡන්ද බලය ක්‍රියාත්මක කිරීමේදී බාධක, ගැටලු සහ අභියෝගවලට මුහුණ දෙයි. විශේෂ අවධානයක් ලැබිය යුතු එක් ප්‍රජාවක් වන්නේ ඛඨර්ඔෂු+ ප්‍රජාවයි. මෙම ප්‍රජාව කෙරෙහි සමාජයේ ආකල්පය වෙනස් විය යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දී ඇති තීන්දුවෙන් ප්‍රබල ලෙස පෙන්නුම් කරන බව පැවසීම අතිශයෝක්තියක් නොවේ. 2022 අගෝස්තු

මාසයේදී, සමලිංගිකත්වය සාපරාධීකරණය කිරීම සහ දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365් වගන්ති සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂයක් විසින් පුද්ගලික මන්ත්‍රීවරුන්ගේ පනත් කෙටුම්පතක් ආරම්භ කරන ලදී. එකී පනත් කෙටුම්පත ඇතැම් පෙත්සම්කරුවන් විසින් විවිධ හේතූන් මත අභියෝගයට ලක් කර තිබියදීත්, ශ්‍රේෂ්ඨාධිකරණය එම පනත් කෙටුම්පතට කොළ එළිය දල්වමින් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සමස්තයක් ලෙස එහි කිසිදු විධිවිධානයක් ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන බව තීරණය කළේය. සමලිංගික සබඳතා සාපරාධී නොවන බවට පත් කිරීමේ තම ස්ථාවරයට සහය දෙන බවද රජය ප්‍රකාශ කළේය. පනත් කෙටුම්පතේ සංශෝධිත අනුවාදයක් 2023 මාර්තු 23 දින ගැසට් කරන ලදී. පනත් කෙටුම්පත 2023 අප්‍රේල් 4 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කිරීමත් සමඟ, පනත් කෙටුම්පතට දැන් පාර්ලිමේන්තුවේ සරල බහුතරයක් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අප්‍රේල් මාසයේ සිට මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර, එය මැතිවරණ කොමිසම හමුවීමට පැෆ්රල් සංවිධානය පෙළඹවීමට හේතු විය. මෙම සාකච්ඡාවට ඩයකෝනියා ශ්‍රී ලංකා ආයතනය සහාය ලබා දුන්නේය. ජනතා පරමාධිපත්‍යයේ අංගයක් වන ඡන්ද අයිතිය කිසිදු බාධාවකින් තොරව භාවිත කිරීමට සුදුසුකම් ඇති සෑම පුරවැසියෙකුටම අවස්ථාව තිබිය යුතුය.

PAFFREL

**16**, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.

**TEL**: el: 011 2 558 570/1 Fax: 011 2 558 572
**FAX**: 11 2 558 572

**Email**: paffrel@sltnet.lk

www.paffrel.lk